25.07.2016 12 ශ්‍රේණිය වාරය.




Learning Resource Center R De Mazenod College Kandana


■ ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

01. i. සන්නිවේදනය පිළිබඳ නිර්වචන 04 ක් ලියන්න.

ii. මහජන සම්බන්ධතා පිළිබඳ නිර්වචන 02 ක් ලියන්න.

iii. සංස්කෘතිය සඳහා නිර්වචන 03 ක් ලියන්න.

iv. ශ්‍රාම් - ඔස්ගුඩ් සන්නිවේදන ආකෘතිය ඇඳ විස්තර කරන්න.

02. i. මාධ්‍ය සංස්කෘතිය අපගේ ජීවිත වලට බලපෑම් ඇතිකරන්නේ කෙසේද යන්න සඳහා කරුණු 04 ක් ඉදිරිපත් කරන්න.

ii. 'මාධ්‍ය සංස්කෘතිය' නිසා සංස්කෘතිය කම්පනය සිදු වී ඇති අයුරු කරුණු 03 ඇසුරෙන් (ඡේද 3 කින්) විස්තර කරන්න.

iii. විවිධ ජාතීන් වාසය කරන රටක ජන මාධ්‍ය වැඩසටහන් තුළ ඉදිරිපත් කිරීමට සුදුසු කරුණු මොනවාදැයි පහදන්න.

iv. 'සංස්කෘතික ආක්‍රමණය' මාධ්‍ය සංස්කෘතිය මගින් සිදුවන ආකාරය විස්තර කරන්න.

03. i. මහජන සම්බන්ධතාවය සහ දැන්වීම්කරණය අතර ඇති වෙනස කරුණු 03 කින් දක්වන්න.

ii. ශ්‍රී ලාංකික සමාජය තුළ මහජන සම්බන්ධතාවය දැකිය හැකි අවස්ථා 04 ක් ලියන්න.

iii. 'මහජන සම්බන්ධතා' ගැන උනන්දුවක් දක්වන ආයතන වල දැකිය හැකි ලක්ෂණ 04 ක් දක්වන්න.

iv. ඔබ අධ්‍යාපනික ආයතනයක "මහජන සම්බන්ධතා නිලධාරියා" නම් රූපවාහිනී මාධ්‍යය ඒ වෙනුවෙන් යොදා ගන්නා ආකාරය විස්තර කරන්න.

04. i. අන්තර්ජාලය හරහා සිදුවන, "ඔන් - ලයින් අධ්‍යාපනයේත්", පන්ති කාමරය තුළ සිදුවන අධ්‍යාපනයේත් වෙනස සන්නිවේදන මූලිකාංග 04 ක් ඇසුරෙන් විස්තර කරන්න.

ii. 'ආකේතීකරණය, විකේත ග්‍රාහකයාගෙන් ද සිදුවේ' පහදන්න.

iii. අවිධිමත් සන්නිවේදන දාම රූප සටහන් මගින් ඇඳ පෙන්වන්න.

iv. අන්තර් පුද්ගල සන්නිවේදනයේ සන්නිවේදකයා සතු ලක්ෂණ 05ක් ලියන්න.

05. i. ගෝලීයකරණය සහ දියුණුවෙමින් පවතින සන්නිවේදන තාක්ෂණය පැවතිය හැකි ස්වභාවයන් කරුණු 03 ක් ඇසුරෙන් කෙටියෙන් විස්තර කනරන්න.

ii. ගෝලීයකරණය නිසා සමාජයේ සිදුවන සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතිමය ප්‍රවණතා 04 ක් විස්තර සහිතව ලියන්න.

iii. සහනුභූතිය, ස්වසංකල්පය, ස්වදේශිකත්ව අන්තර් ඥාණය ගැන කෙටියෙන් විස්තර කරන්න.

06. අනුරාධපුර පැවැත්වුණු ජනතා උද්ඝෝෂණයක් පිළිබඳ තොරතුරු රූපවාහිනී වාර්තාකරුවෙක් විසින් තමන් සේවය කළ මාධ්‍ය ආයතනය වෙත ලබා දුන්නද එය පුවෘත්ති විකාශයට ඇතුළත් නොවිණි.

i. ජනමාධ්‍ය වාර්තාකරණය තුළ මෙබඳු සිදුවීම් හඳුන්වන සංකල්පය කුමක්ද? එම සංකල්පය හඳුන්වාදුන්නේ කවුද?

ii. රූපවාහිනී මාධ්‍යය තුළ මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීමට මූලිකවන පුද්ගලයන් සිව්දෙනෙකු පිළිබඳ කෙටියෙන් හඳුන්වන්න.

iii. සන්නිවේදනයේදී සංදේශය ආචාරශීලී නොවන ආකාර තුනක් රූපවාහිනී මාධ්‍ය සම්බන්ධ උදාහරණ සහිතව විස්තර කරන්න.

iv. තොරතුරු සම්පාදන කාර්යයේදී නව මාධ්‍යය රූපවාහිනී මාධ්‍යයට වඩා ජනතාව අතර ජනප්‍රිය වෙමින් පවතියි. ඒයට හේතු වූ කරුණු 04 ක් විස්තර කරන්න.

07. 1. සම්ප්‍රදායික දෘශ්‍ය සන්නිවේදන ක්‍රම 02 ක් හා නූතන දෘශ්‍ය සන්නිවේදන ක්‍රම 02 ක් නම් කරන්න.

2. වාචික සන්නිවේදනයේ සාර්ථකත්වයට බලපාන ප්‍රධාන කරුණු 04 ක් ලියන්න.

3. ශ්‍රව්‍ය මාධ්‍යයක් වන ගුවන්විදුලියේදී භාෂාව භාවිත කළ යුතු ආකාරය පිළිබඳ කරුණු 03 ක් විස්තර කරන්න.

4. සන්නිවේදනයේ ආරම්භය හා නූතනය දක්වා එහි ගමන් මග පිළිබඳව පුවත්පතක පළකිරීම සඳහා සුදුසු ශාස්ත්‍රීය ලිපියක් රචනා කරන්න.